**ඉමදූව ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
**-----------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**--------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 31 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**--------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ඉමදූව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
----------------------------------------

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුළ නිමකල කෝඔල හොරමඩුල්ල ප්‍රජා ජල ව්‍යාපෘතිය සංවර්ධනය කිරීමේ කර්මාන්තය සඳහා ලැබී තිබුණු රු.267,583 ක් වූ ප්‍රාග්ධන ආධාර ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ඉටු නොකරන ලද කර්මාන්තයක් හා 2018 වර්ෂයේ ඉටු කිරීමට නියමිත කර්මාන්ත දෙකක් වෙනුවෙන් එකතුව රු.12,859,948 ක් ගෙවිය යුතු ප්‍රාග්ධන ආධාර යටතේ ගිණුම් ගතකර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු විගණන ගාස්තු සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

**1.3.2 නොසැසඳුනු ගිණුම්**
**---------------------**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.62,117,502 ක් වූ ගිණුම් විෂයයන් 06 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර අසමානතා වල එකතුව රු.55,258,189 ක් විය.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**ලැබිය යුතු ගිණුම්**

එකතුව රු.213,582 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 08 ක් සමාලෝචිත වර්ෂයේදීත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම**

**තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.138,178,383 ක් වූ ගිණුම් විෂයයන් 07 ක් විගණනයේ දී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම් |
|---|---|---|
| **(අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති** | | |
| (i) රීති 33 | - | වරිපනම් බදු ගෙවීම් පැහැර හැර ඇති පුද්ගලයින් පිළිබඳ ලැයිස්තු සහ දේපල තහනම් කිරීමේ වරෙන්තු ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. |
| (ii) රීති 59 | - | සභා බලප්‍රදේශය තුළ සමීක්ෂණ පවත්වා කර්මාන්ත පිළිබඳ ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| මුදල් රෙගුලාසි 571(1)(2) | 4,926,802 | 2017 දෙසැම්බර් 31 දිනට වර්ෂ 02 ක කාලයක් ඉක්ම වූ තැන්පතු ශේෂ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. |

### 1.3.6 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 1987 ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්ති ප්‍රකාර සභා යෝජනා සම්මතයන් කර විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ගැනීමෙන් තොරව 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර ලෙස ගිණුම් ගතකර තිබුණු රු.23,251,988 ක් සමාලෝචිත වර්ෂයේ ලාභයට එරෙහිව කපාහැර තිබූ අතර, එලෙසම ජර්නල් සටහන් 25 මඟින් 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය සඳහා ගෙවිය යුතු ප්‍රාග්ධන ආධාර ලෙස ගිණුම් ගතකර තිබුණු රු.24,098,739 ක් ද සමාලෝචිත වර්ෂයේ දී ලාභයට ගලපා තිබුණි.

(ආ) පළාත් පාලන ක්‍රීඩා උළෙල සඳහා අනුමැතියකින් තොරව රු.46,714 ක් සභා අරමුදලින් වැයකර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,843,369 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,014,609 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම්හා බදු | 151,200 | 123,209 | 300,260 | 248,391 | 151,200 | 123,109 | 184,601 | 352,275 |
| කුලී | 3,100,000 | 3,139,202 | 3,154,202 | - | 2,350,000 | 2,478,487 | 2,494,487 | - |
| බලපත්‍ර ගාස්තු | 200,000 | 153,700 | 170,900 | 152,466 | 1,800,000 | 102,100 | 114,650 | 159,916 |
| වෙනත් ආදායම් | 2,900 | - | 21,106 | - | 2,000 | - | 45,217 | - |
| | 3,454,100 | 3,416,111 | 3,646,468 | 400,857 | 4,303,200 | 2,703,696 | 2,838,955 | 512,191 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

**-----------------------------------------**

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රු.3,454,100 ක් ද, බිල්කළ ආදායම රු.3,416,111 ක් විය. රු.512,191 ක් වූ ආරම්භක හිඟය සමඟ අයවිය යුතු මුදල රු.3,928,302 ක් වුවද, වර්ෂය තුළ රැස් කළ ආදායම රු.3,646,468 ක් වීමෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට හිඟ ආදායම රු.400,857 ක් විය.

**2.2.3 වරිපනම් හා බදු**

-------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට සහ ඉකුත් වර්ෂයට අදාළව අයකර ගතයුතුව තිබුණු රු.423,836 ක් වූ වරිපනම් බදු මුදලින් සමාලෝචිත වර්ෂය තුළ සියයට 47 ක් අය කරගෙන නොතිබුණි.

(ආ) 1999 වර්ෂයෙන් පසුව තක්සේරුවක් සිදු නොකිරීම නිසා ලැබිය යුතු ප්‍රමාණාත්මක වරිපනම් ආදායම් සභාවට අහිමි වී තිබුණි.

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) හා (2) වගන්ති ප්‍රකාරව සහකාර කොමසාරිස්වරයාගේ අනුමැතිය ඇතිව දියුණු කළ ප්‍රදේශ වශයෙන් හඳුනාගෙන වරිපනම් බදු අයකර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

**2.2.4 අක්කර බදු**

-------------

ඉකුත් වර්ෂය සහ සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අයකර ගතයුතු රු.67,891 ක් වූ අක්කර බදු මුදලින් සමාලෝචිත වර්ෂය තුළ රු.18,170 ක් හෙවත් සියයට 26 ක් අයකර ගෙන තිබුණි. මේ හේතුව නිසා වර්ෂය අවසාන වනවිට හිඟ මුදල රු.49,721 ක් වී තිබුණි.

**2.2.5 බලපත්‍ර ගාස්තු සහ ව්‍යාපාර බදු**

-----------------------------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාළව අයකර ගත යුතුව තිබූ බලපත්‍ර ගාස්තු හා ව්‍යාපාර බදු වටිනාකම පිළිවෙලින් රු.325,116 ක් හා රු.1,172,300 ක් විය. සමාලෝචිත වර්ෂයේ වෙළඳ බලපත්‍ර ගාස්තු අයවීම සියයට 53 ක් හා ව්‍යාපාර බදු අයවීම සියයට 63 ක් වූ අතර, වර්ෂය අවසානයට වූ හිඟ බදු මුදල් අයකර ගැනීම සඳහා සභාව කටයුතු කර නොතිබුණි.

**2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු වෙනුවෙන් රු.16,354,807 ක් හා උසාවි දඩ වෙනුවෙන් රු.2,017,996 ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**-----------------------------**

**3.1 කාර්යයසාධනය**

**-------------------**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා

සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ව්‍යාපෘති ප්‍රමාද කිරීම**

(i) පහළවත්ත, බැද්දෙගෙදර, කළුවල ප්‍රධාන මාර්ගය ගමනාගමනයේ යෙදිය නොහැකි ආකාරයෙන් අබලන් තත්ත්වයට පත්ව ඇති බැවින්, සභා අරමුදල් යොදවා මෙම මාර්ගය පිළිසකර කරන ලෙස පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SA/16/2-259 හා 2017 ඔක්තෝබර් 02 දිනැති ලිපිය මඟින් නියෝග කර තිබූ නමුත්, එම කර්මාන්තයේ වැඩ කටයුතු 2018 මැයි 09 දින වන විටත්, ආරම්භ කර නොතිබුණි.

(ii) පළාත් නිශ්චිත ප්‍රදාන යටතේ 2017 දෙසැම්බර් 31 දිනට නිම කළයුතු ඉමදූව නගරයේ සනීපාරක්ෂක කාණු පද්ධතියක් ඉදිකිරීම සඳහා රු.1,000,000 ක් හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන සඳහා රු.1,000,000 ක් ඇස්තමේන්තු කර තිබුණද, 2018 මැයි වන විටත් එම කර්මාන්ත ආරම්භ කර නොතිබුණි.

**(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

සභාවට කසළ කළමනාකරණය සඳහා විධිමත් වැඩපිළිවෙලක් නොතිබුණු අතර, හොරතොට කන්ද නැමති අක්කර 10 ක පමණ විශාල භූමියේ අක්කර 1/4 ක පමණ කොටසකට කසළ බැහැර කරමින් පැවතුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) දිනකට එකතු වන ටොන් 01 ක පමණ කසළ ප්‍රමාණයකින් දිරන කසළ එම භූමියේ වලවල් කපා, පස් වලින් වසා දැමීම සිදු කරමින් තිබුණි.

(ii) නොදිරන කසළ ඉමදූව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 02 ක ගබඩා කර තිබුණු අතර, 2017 වර්ෂය තුළ මෙසේ එකතු කරන ලද නොදිරන ද්‍රව්‍ය අලෙවියෙන් සභාව රු.3,200 ක ආදායමක් උපයාගෙන තිබුණි.

(iii) සභාවට කසළ බැහැර කිරීම පිළිබඳව විධිමත් වැඩපිළිවෙලක් නොතිබුණු අතර, පරිසර බලපත්‍රයක් ලබා නොගෙන ඉඩමට කසල බැහැර කරමින් පැවතුණි.

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සහා බලප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2010 අගෝස්තු 17 දිනැති අංක පීඊ/01/01 දරන විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව පළාත් පාලන ආයතනවල වීථි ආලෝකකරණය පිළිබඳව කටයුතු කර නොතිබීම නිසා සභාව විසින් නඩත්තු කරන වීථි පහන් 2,000 ක් සඳහා දරනු ලබන වියදම් ප්‍රතිපූර්ණය කර ගැනීමට සභාවට නොහැකි වී තිබුණි.

(ආ) සභාව සතු කැබ් රථයක් 2017 ඔක්තෝබර් 02 දින අනතුරකට ලක් වී තිබුණු අතර මුදල් රෙගුලාසි 104(3) හා 104(4) ප්‍රකාරව වාර්තා 2018 මැයි 09 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ඊට අමතරව සිදු වූ අලාභය මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව නැතිවීම් / හානිවීම් පිළිබඳ ලේඛනයෙහි ඇතුළත් කර නොතිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

---------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා 28 දෙනෙකු හා අනුමත නොවූ තනතුරුවල 12 දෙනෙකු වශයෙන් අතිරික්ත සේවක සංඛ්‍යාව 40 ක් වූ අතර, පුරප්පාඩු තනතුරු 05 ක් විය. කෙසේ වුවද, අතිරික්ත කාර්ය මණ්ඩලය විධිමත් කර ගැනීමට හා පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(ආ) අනියම්, තාවකාලික, ආදේශක හා කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණු සේවකයින් 12 දෙනෙකුගේ වැටුප් හා දීමනා ගෙවීම සඳහා රු.2,998,463 ක් සභා අරමුදලින් වැයකර තිබුණි.

(ඇ) මාවැල්ල හොරතොට කන්ද ඉඩමේ 2015 වර්ෂයේ සිට පවත්වාගෙන යන ආදාහනාගාරය සඳහා ආදාහනාගාර ක්‍රියාකාරීවරයකු හා සහායකයෙකු යොදාගෙන නොතිබුණි.

(ඈ) සභාවේ අනුමත සේවක සංඛ්‍යා සැලැස්මට අනුව කාර්යාල කම්කරු තනතුරෙහි පුරප්පාඩු නොතිබිය දී කාර්යාල කම්කරු සේවිකාවක් බඳවාගෙන 2014 ඔක්තෝබර් 24 දින සිට 2018 ජූලි දක්වාම සේවයේ යොදවා තිබුණු අතර, එම සේවිකාවට ද්විතීයික කාණ්ඩයට අයත් කළමනාකරණ සහකාර සේවයේ තනතුරුවල රාජකාරි පවරා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.4,746,437 ක් වූ සභාවේ සේවක ණය ශේෂයට ඇතුළත් සේවය හැර ගිය සේවකයින් 03 දෙනෙකුගෙන් රු.8,185 ක් සහ 2012, 2013 හා 2015 වර්ෂවල ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 03 දෙනෙකුගෙන් රු.78,134 ක් සභාවට අයවීමට තිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 පවරා නොගත් වත්කම්**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් භාවිතයට යොදා ගන්නා රු.1,100,100 ක් වටිනා කැබ් රථයක අයිතිය පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) 2006 වර්ෂයේ දී හබරාදූව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය හබරාදූව හා ඉමදූව ප්‍රාදේශීය සභා ලෙස වෙන් කිරීමේ දී කැබ් රථයක් ලබා දී තිබුණ ද, එහි අයිතිය ඉමදූව ප්‍රාදේශීය සභාව වෙත පවරාගෙන නොතිබුණි. එමෙන්ම මෙම කැබ් රථය අළුත්වැඩියා කිරීම සඳහා යාන්ත්‍රික ඉංජිනේරුවරයාගෙන් ඉල්ලා තිබුණ ද වාර්තාව ලබා නොදීම හේතුවෙන් අළුත්වැඩියා කිරීමකින් තොරව නිෂ්ක්‍රීයව ගාල්කර තිබුණි.

**3.4.2 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතන්ත්‍ර පාලනය පිළිබඳ අමාත්‍යාංශයෙන් 2014 දෙසැම්බර් 20 දින සභාවට ලබා දී තිබුණු ටිපර් රථය ලබාදුන් දින සිටම ධාවනය සඳහා යොදාගෙන නොතිබුණු අතර, නිෂ්ක්‍රීයව ගාල්කර තිබුණි.

(ආ) සභාවට අයත් ට්‍රැක්ටර් 03 ක් ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයේ පවතින අතර, එම වාහන භාවිතයෙන් ඉවත් කිරීම පිළිබඳ 2015 ජුලි 10 දිනැති අංක 02/2015 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත විස්තර දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.

(අ) වියදම් විෂයයන් 07 ක එකතුව රු.10,651,665 ක් වූ ඉතිරිවීම් දක්නට ලැබුණු අතර, ඉතිරිවීම් ප්‍රතිශතය සියයට 01 සිට සියයට 60 අතර පරාසයක විය.

(ආ) ආදායම් විෂයයන් 07 ක ළඟාකර නොගත් ඉලක්කගත ආදායම්වල එකතුව රු.19,982,314 ක් වූ අතර, එම වටිනාකම් සියයට 19 සිට සියයට 75 දක්වා පරාසයක විය.

**4.2 අභ්‍යන්තර විගණනය**

------------------------

සභාව සඳහා අභ්‍යන්තර විගණන නිලධාරියෙක් පත්කර තිබුණ ද, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**4.3 විගණන හා කළමනාකරණ කමිටු**

------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

**4.4 නොවිසඳී ඇති විගණන ඡේද**

------------------------------

ඉකුත් වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාවේ 2.2.3(අ) හා (ඈ), 2.2.5(අ) සහ (ආ) ඡේදවලින් පෙන්වා දෙන ලද අඩුපාඩු නිවැරදි කිරීමට එකඟ වී තිබුණු නමුත්, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

--------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය හා ලේඛන පැවැත්වීම | (i) | ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබීම. |
| | | (ii) | මූල්‍ය ප්‍රකාශන සහ උපලේඛනවල ශේෂ අසමාන වීම. |
| | | (iii) | ලේඛන පවත්වා නොතිබීම. |
| (ආ) | ස්ථාවර වත්කම් | | විස්තරාත්මක හා විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඇ) | වාහන පාලනය | (i) | ඇතැම් වාහන නිෂ්ක්‍රීයව පැවතීම. |
| | | (ii) | වාහන අනතුරු සම්බන්ධව මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) ආදායම් රැස්කිරීම | (i) | හිඟ ආදායම් අයකර ගැනීමේ අසාමාන්‍ය කාල ප්‍රමාදයක් පැවතුණි. |
| | (ii) | වාර්ෂික ආදායම් වැඩි කිරීම පිළිබඳ සමීක්ෂණ පවත්වා නොතිබුණි. |
| | (iii) | නව ආදායම් උත්පාදන මාර්ග කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි. |
| (ඉ) සේවක මණ්ඩල කළමනාකරණය | | සේවක සංඛ්‍යා සැලැස්ම විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |